සැකසුම - චතුරිකා ප්‍රියදර්ශනී
ර/නිවි/කහවත්ත මධ්‍ය මහා


# සති පාසල 6

## නාට්‍ය ශෛලීන්ට උචිත සංවාද භාවිත කරමු.

- සංවාද භාවිතය වාචික අභිනයට අයත් වේ.
- ලෝකධර්මී ශෛලියට අයත් සංවාද භාවිතයෙන් සහ **නාට්‍ය** ධර්මී ශෛලියට අයත් සංවාද භාවිතය **නාට්‍ය** වල දැකිය හැකි ය.
- **නාට්‍ය** ධර්මී සංවාදවල රිද්මයක්, තාලයක් ඇති අතර, ගීත කොටස් බහුල ව මෙම නාට්‍යවල දැකිය හැකි ය.
- **නාට්‍ය** ධර්මී සඳහා විවිධ ජන නාටකවලින් ද රබන් පද, සව්දම් වැනි අංගවලින් ද තාල හා පද යොදාගෙන ඇත.
- **නාට්‍ය** ධර්මී සංවාද ඉදිරිපත් කරන විට සංගීතය හා නර්තනය ද යොදාගනී.
- **නාට්‍ය** ධර්මී **නාට්‍ය** සඳහා උදාහරණය ලෙස: මනමේ, සිංහබාහු, නරිබෑණා, එලොව ගිහින් මෙලොව ආවා, වැනි **නාට්‍ය** වල එන **නාට්‍ය** ධර්මී සංවාද දැක්විය හැකි ය.
- ලෝක ධර්මී **සම්ප්‍රධායට** වඩා සමීප සංවාද, එදිනෙදා ව්‍යවහාර භාෂාවට සමීප වන අතර සමාන්‍ය ජීවිතයේ ගැහැණුන් මිනිසුන් කථා කරන ආකාරයට සංවාද මෙහි දී භාවිත වුවත් ඒවා නාට්‍යෝචිත ව යොදාගත යුතු වේ.

උදා:- ජනේලය, සුබ සහ යස, තලමල පිපිලා, විකෘති

## නාට්‍යධර්මී සංවාද සඳහා උදාහරණ

ගමමහගේ : තෝව දෙන්නෙත් නරියටයි
තෝව ගන්නෙත් නරියෙකුයි
තෝව දෙන්නෙත්, තෝව ගන්නෙත්
කැලේ ඉන්නා නරියෙකුයි

(නරිබෑනා)

හිඟන්නා : මෙලොවෙ දී තව තව ලැබෙන්න
එලොවෙ දී දුක නැතුව ඉන්න
දිව මාළිග පහළ වෙන්න
පිනට මොකුත් මට ලැබෙන්න

දෙමවුපියන් දූ දරුවන්
නාමෙට පින් පමුණුවන්න
මළගිය ඇත්තන් වෙනුවෙන්
පිනට මොකුත් මට ලැබෙන්න

(එලොව ගිහින් මෙලොව ආවා)

නරියා : ඉතිං සැනසෙන්න
හොඳින් පුළුවන්නෙ
දෙමව්පියො දෙන්න
ඇවිත් අර ඉන්නෙ
මෙතෙක් උඩ පැන්නෙ
ගමින් එන කන්නෙ
හුඟක් දෑවැද්ද
ගෙනැත් ඇති වෙන්නෑ
ගොඩක් බඩු මුට්ටු
ගෙනත් ඇති වෙන්නෑ
හොඳින් කලරින්න
ඉතින් පුළුවන්නෙ (නරිබෑනා)

කළුහාමි මමත් හිටිය හම්බ වෙන්න
එලොව ගිහින් ආපු කෙනෙක්
එහේ ඉන්න මගේ දුවගෙ
සුවදුක් දැනගන්න අහල
කළුහාමිගෙ දුව කිව්වම
කොයි කවුරුත් දන්නව ඇති
කොහොමද දුව සනීපෙන් ද?
අපිව මතක නැති වෙලා ද?

(එලොව ගිහින් මෙලොව ආවා)

නරියා : සුරුට්ටු ද බොන්න - බුලත් ම ද කන්නෙ
ගමරාළ : හෙනං ගෙන එන්න - සුරුට්ටුව බොන්න
නරියා : පයිං ඇවිදිල්ල - මහන්සි ද මන්ද
කපුරාළ : ගොඩින් පැන ගත්ත - හුණක් ළඟ හින්ද
නරියා : මෙහෙත් හරි වැස්ස - වෙලත් උතුරන්න (නරිබෑනා)

- **<u>ලෝක ධර්මී සංවාද සඳහා උදාහරණ</u>**

රජු - මට දවල් වෙනකන් බුදියන්ඩ ඕනෑ
මහ ඇමති - එසේය මහරජතුමනි
රජු - මේ වන්දිභට්ටයින් ගේ ගායනාව නතර කරන්ඩ ඕනෑ
මහ ඇමති - එසේ ...... අවසර මහරජතුමනි, වන්දිභට්ටයින් ගේ ගායනා මහා සම්මත කාලයේ හිටන් ඉටු කරන්නා වූ චාරිත්‍රයකි.

මහ රජු - මොන සම්මත කාලයේ ඉඳලා තිබුණත් මට ඒක හිරිහැරයක්

මහ ඇමති - සමාවෙන්න මහ රජතුමනි, රාජ ගෞරවය පවතින්නේ පරම්පරාවෙන් පරම්පරාවට පැවතුණ චාරිත්‍රයක් උඩ

| | | |
|---|---|---|
| රජු | - | ඇමති, ඇමති මෙහෙ බලනවා, චාරිත්‍ර දද කරන්ට ඕනෑ. |
| මහ ඇමති ආරක්ෂා | - | රාජ චාරිත්‍ර ආරක්ෂා වෙන කොට රාජ ගෞරවය වෙනවා. රාජ ගෞරවය ආරක්ෂා ඕනෑ. |

රජු - ඒ උනාට මිනිහෝ නිදිමතේ පුළුවන් ද හැමදාම රටක් පාලනය කරන්ඩ.

(සුභ සහ යස)

## පැවරුම

1. **නාට්‍ය සංවාද අයත් වන්නේ කවර අභිනයට ද?**

2. **නාට්‍ය ධර්මී සංවාද තුළ දක්නට ලැබෙන ලක්ෂණයක් ලියන්න.**

3. **ලෝක ධර්මී සංවාද තුළ දක්නට ලැබෙන ලක්ෂණයක් ලියන්න.**

4. **පහත සඳහන් චරිත යොදා ඔවුන් අතර සිදු කෙරෙන සංවාද ලියා දක්වන්න.එහිදී එදිනෙදා භාවිත කරන බස් වහර යොදන්න.**

    - **වරදක් කර හසුවූ සිසුවෙක් හා විදුහල්පති අතර ඇති වන සංවාදය.**

    - **ගමරාළගේ කුකුල් කොටුවෙන් කුකුළෙකු සොරකම් කර යන අප්පුවා, ගමරාළ ගේ අතට හසු වූ පසු ගමරාළ හා අප්පුවා අතරඇති වන සංවාදය.**

5. **පහත සඳහන් චරිත අතර සංවාද ලිඛිත බස යොදා නිර්මාණය කරන්න.**
    - **මිය යෑමට සිටින පිය රජු හා කුමාරවරුන් තිදෙනෙකු අතර ඇතිවන සංවාදය**
    - **අන්දරේ සීනි කෑමෙන් පසු රජතුමා හා අන්තරෙ අතර ඇතිවන සංවාදය.**

**6. ඔබ ඉහත නිර්මාණය කළ සංවාදයන් ඉදිරිපත් කිරීමට උත්සහ කරන්න. (5) ට අදාල සංවාද තාලානුකූල ව ඉදිරිපත් කිරීමට උත්සහ කරන්න.**

## වැඩිදුර අධ්‍යනය සඳහා

### නරිබෑනා නාට්‍ය

https://youtu.be/g5xR3PX3yzs

### එළව ගිහින් මෙලොව ආවා

https://youtu.be/wazWAsU94RA

### සුභ සහ යස

https://youtu.be/KJRmdTra6MQ